NALANDA VIDYALAYA **නාලන්දා විද්‍යාලය - කොළඹ 10**

ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 6 ශ්‍රේණිය | නර්තනය | ඒකකය : 8 |
|---|---|---|

## තෛපොංගල් උත්සවය

- **හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද දී ඇති වරහන තුළ යොදන්න.**

(1) තෛපොංගල් උත්සවය ඉස්ලාම් ආගමික උත්සවයකි. (    )

(2) තෛපොංගල් උත්සවයේදී කෝලම් රටා, නිවෙස් ආශ්‍රිත සැරසිලි අංග භාවිත කෙරේ. (    )

- **නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

(3) තෛපොංගල් උත්සවය පවත්වන්නේ ........................................................ මාසයේ දීය.

(4) තෛපොංගල් උත්සවයට සූදානම් වන්නේ ........................................................ මාසයේ සිට ය.

(5) තෛපොංගල් උත්සවය පවත්වන දිනය තෙක් පුරා මාසයක් ........................................................ කැමෙන් වැලකී සිටිති.

(6) තෛපොංගල් උත්සවයේ දී පිරිසිදු කර ගත් ගෙබිම මැද කහ කුඩු සහ සහල් පිටිවලින් ........................................................ නිර්මාණය කරයි.

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(7) තෛපොංගල් යනු,

1) ඉස්ලාම් ආගමික උත්සවයකි.
2) හින්දු ආගමික උත්සවයකි.
3) ජෛන ආගමික උත්සවයකි.
4) කිතුනු ආගමික උත්සවයකි.

(8) තෛපොංගල් උත්සවය යෙදෙන්නේ,

1) මාර්තු මාසයේ දී ය.
2) ජනවාරි මාසයේ දී ය.
3) අප්‍රේල් මාසයේ දී ය.
4) දෙසැම්බර් මාසයේ දී ය.

(9) තෛපොංගල් උත්සවය පවත්වනු ලබන්නේ,

1) රෝගාපදා දුරු කර ගැනීමට ය.
2) විනෝදාස්වාදයට ය.
3) හිරු දෙවියන් පිදීමට ය.
4) මළගිය අයට පින් දීමට ය.

(10) තෛපොංගල් උත්සවයේ දී යොදා ගනු ලබන සැරසිල්ලක් වන්නේ,

1) කෝලම් 2) කුම්මි 3) කෝලාට්ටම් 4) කරගම්

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(11) තෛපොංගල් උත්සවයේ දී ගෙට ඇතුළුවන දොර දෙපස හෝ මිදුලට ප්‍රවේශ වන කඩුල්ල දෙපස,
1) කොහොඹ අතු එල්ලීම කරති.
2) කෙසෙල් ගස් සහ උක්ගස් සිටුවා තබති.
3) ගොප් කොළයෙන් ගොප් ගෙඩි සාදා සවි කරති.
4) අලංකාර කොඩි වැල් වලින් සරසති.

(12) කෝලම් සැරසිලි යොදා ගෙබිම සරසන්නේ,
1) රාමසාන් උත්සවයේදී ය.
2) මහා ශිව රාත්‍රී උත්සවයේදී ය.
3) තෛපොංගල් උත්සවයේදී ය.
4) නවරාත්‍රී උත්සවයේදී ය.

(13) තෛපොංගල් උත්සවයේ දී ගවයා පිදීමේ චාරිත්‍රය පවත්වනු ලබන්නේ,
1) පොංගල් දිනට පෙර දිනයේ දීය.
2) පොංගල් දිනයේ දීය.
3) පොංගල් දිනට පසු දිනයේ දීය.
4) තන්නි පොංගල් දිනයේ දීය.

(14) පොංගල් නම් වූ කිරිබත හිරු දෙවියන් වෙත පුදනු ලබන්නේ,
1) ගෘහ මූලිකයා විසිනි
2) ගෘහණිය විසිනි
3) ගෙදරට කැඳවන පූජකයා විසිනි
4) පවුලේ වැඩිමහල් දරුවා විසිනි

(15) 'පට්ටි පොංගල්' යනු කුමක් ද?
1) තෛපොංගල් දිනයේ සාදන සුවිශේෂ කිරිබතයි.
2) තෛපොංගල් දිනයේ හිරු උදාවන සුවිශේෂ නැකතයි.
3) සහල් පිටි, කහ කුඩු යොදා පොළොව මත නිර්මාණය කරන විචිත්‍ර සැරසිල්ලයි.
4) ගවයන් කරත්තවල බැඳ පොංගල් පොංගල් කියමින් ගමවටා කරනු ලබන සංචාරයයි.

(16) තෛපොංගල් උත්සවයට සමගාමීව ලංකාවේ දක්නට නොලැබෙන එහෙත් දකුණු ඉන්දියාවේ දක්නට ලැබෙන උත්සවය කුමක් ද?
1) පෝගී
2) පොංගල්
3) මාඩු පොංගල්
4) තන්නි පොංගල්

- කෙටි පිළිතුරු සපයන්න.

(17) 'තෛපොංගල්' යන්නෙහි අර්ථය කුමක් ද?
(18) තෛපොංගල් උත්සවය පැවැත්වීමේ ප්‍රධාන හේතුව සරලව පැහැදිලි කරන්න.
(19) තෛපොංගල් උත්සවය වර්ණවත් කරන සැරසිලි 2 ක් නම් කරන්න.
(20) තෛපොංගල් උත්සවයේ දී අනුගමනය කරන චාරිත්‍ර 3 ක් නම් කරන්න.
(21) පොංගල් නැමැති කිරිබත සෑදීම සඳහා එකතු කර ගන්නා අමුද්‍රව්‍ය 3 ක් නම් කරන්න.
(22) තෛපොංගල් උත්සවයේ දී ගෙබිම අලංකාර කරන කෝලම් රටාවක් ඇඳ වර්ණවත් කරන්න.

**සැකසුම : නවමල් ජයවීර මයා**

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk